# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් තිමෝතියස් තුමන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

1 තිමෝති 6 : 13 – 16

"ජේසුස් වහන්සේගේ ආගමනය තෙක් මේ ආඥාව පිළිපදින්න."

සකල ජීවයට උල්පත වූ දෙවියන් වහන්සේ ද, පොන්තියුස් පිලාත් ඉදිරියෙහි ඇදහීම නිර්භීත ලෙස ප්‍රකාශ කළ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ද අබිමුවෙහි මා ඔබට භාර දෙන කටයුත්ත මෙයයි. අපේ ස්වාමින් වන ඔබට භාර දෙන කටයුත්ත මෙයයි. අපේ ස්වාමින් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ආගමනය තෙක් මේ ආඥාව කිසිම දෝෂයක් හෝ කැළලක් හෝ නැති ව පිළිපදින්න. දෙවියන් වහන්සේගේ එම ආගමනය නියමිත කාලයේ දී එළිදරව් කරන සේක. උන් වහන්සේ වනාහි භාග්‍යවත්, අසහාය, අධිපති, රාජාති රාජ, දේවාති දේව නැනැන් වහන්සේ ය. උන් වහන්සේ පමණක් අමරණීය ය. කිසිවෙකුට ළඟාවිය නොහැකි ආලෝකයෙහි උන් වහන්සේ වසන සේක. කිසිවෙක් කිසි කලෙක උන් වහන්සේ දැක නැත. දකින්නටත් බැරි ය. උන් වහන්සේට ගෞරවයත්, සදාතන පරාක්‍රමයත් වේවා! ආමෙන්.

දේව වචනය මෙසේ ය.

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# සෙනසුරාදා

## පිළිතුරු ගීය

ගීතාවලිය 100 : 2-5

පිළිතුර: ප්‍රීති ගී ගයමින් සමිඳාණන් ඉදිරියට පැමිණෙන්න.

ගීය:

මුළු පොළෝ වැසියෙනි, සමිඳුන් හට ප්‍රීති ඝෝෂා පවත්වන්න.
සමිඳුන් හට ප්‍රීතියෙන් වැඳ පුදා, ප්‍රීති ගී ගයමින් එතුමන් ඉදිරියට පැමිණෙන්න.

සමිඳාණන් දෙවිඳුන් බව දැනගන්න.
අප මැව්වේ එතුමාණෝ ය. අපි එතුමන්ගේ ය.
එතුමන්ගේ සෙනඟ ය. එතුමන්ගේ තණ බිම්වල බැටළුවෝ ය.

තුති පුදා එතුමන්ගේ වාසල් දොරටුවල ද තුති ගී ගය ගයා,
එතුමන්ගේ මන්දිරවලට ද ඇතුළු වන්න.

මන්ද, සමිඳාණෝ යහපත් ය. එතුමන්ගේ ප්‍රේමය ස්ථිර ය.
සදහට ම පවත්නේය. පරපුරෙන් පරපුර එතුමන්ගේ විශ්වාසවන්තකම පවත්නේය.

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# සෙනසුරාදා

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබේ ව්‍යවස්ථාවෙහි පුදුම අගයන් දක්නා පිණිස අපගේ ඇස් පැහැදුව මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
අවංක පිරිසිදු සිතකින් දේව වචනය අසා, පිළිපැද, නොපසුබට වීර්යයෙන් ඵල දරන්නෝ භාග්‍යවන්තයෝ ය.
ආලේලූයා!

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# සෙනසුරාදා

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 8: 4–15

"දේව වචනය පිළිගෙන නොපසුබට වීර්යයෙන් පල දරමු."

ඒ ඒ නුවරින් මිනිසුන් ජේසුස් වහන්සේ වෙත පැමිණ මහා පිරිසක් රැස්වූ කල උන්වහන්සේ උපමාවකින් මෙසේ වදාළ සේක.

"වපුරන්නෙක් බීජ වපුරන්න නික්මිණි. ඔහු වපුරන කල බීජ සමහරක් මඟ දිගේ වැටී පයින් පෑගිනි. අහසේ කුරුල්ලෝ ඒවා අවුලා කෑහ. අන් සමහරක් ගල් බිමෙහි වැටී පැළ වූ කෙණෙහිම දිය සීරාව නැති බැවින් වියළී ගියේය. අන් සමහරක් කටු පැළ අතර වැටිනි. කටු පැළ ද ඒ සමඟම වැඩී ඒවා යටපත් කර දැමීය. අන් සමහරක් සරු බිමේ වැටී, පැළ වූ විට එකකින් සිය ගුණයක් අස්වැන්න ඇති විය." උන්වහන්සේ මෙසේ වදාරා තවද රටත් "සවන් ඇත්තෝ සවන් දෙත්වා" යි හඬ නගා වදාළ සේක."

උන්වහන්සේගේ ශ්‍රාවකයෝ "ඒ උපමාවේ තේරුම කිමෙක්දැ"යි උන්වහන්සේගෙන් විමසූහ. උන්වහන්සේ ඔවුන්ට මෙසේ වදාළ සේක. "දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ අභිරහස් පිළිබඳ අවබෝධය ඔබට දී ඇත. එහෙත් දැක දැකත් නොදක්නා පිණිස ද අස අසාත් නොවටහාගන්නා පිණිස ද සෙසු අයට ඒවා උපමා මගින් දෙනු ලැබේ.

උපමාවේ තේරුම මේය. බීජ නම් දෙවියන් වහන්සේගේ වචනය ය. මඟ අසල වූවෝ නම් වචනය ඇසූ අය ය. එහෙත් ඔවුන් අදහා ගැළවීම නොලබන පිණිස

## සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
## සෙනසුරාදා

යක්ෂයා අවුත් ඔවුන්ගේ සිත්වලින් වචනය පැහැර ගන්නේය. ගල් බිමෙහි වූවෝ නම් වචනය අසා සතුටින් පිළිගන්න නමුත් සිත්හි රඳා නොපවතින බැවින් කලකට පමණක් අදහා, පරීක්ෂා කාලයෙහි වැටී යන අය ය. කටු අතර වැටුණු බීජ යන්නෙන් අදහස් කරනුයේ වචනය අසා ජීවිතයේ කම්කටොළුවලින් ද වස්තුවෙන් ද ඉඳුරන් පිනවීමෙන් ද වචනය හිර වී සම්පූර්ණ ඵල නොදරන අය ය. සරු බිමේ වැපුරූ බීජ යන්නෙන් අදහස් කරනුයේ අවංක පිරිසිදු සිතකින් වචනය අසා, පිළිපැද, නොපසුබට වීර්යයෙන් ඵල දරන අය ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.